# XVII පරිච්ඡේදය

## කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයන්හි / විද්‍යායතනයන්හී සේවයේ නියුක්ත වුවන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සතු අයිතිය

1. විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත සේවය
2. පෞද්ගලික උපදේශන සේවා සහ / හෝ ඉගැන්වීමේ කටයුතු
3. ප්‍රතිරූපන අයිතිය (Copy right)
4. නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍ර

## XVII වන පරිච්ඡේදය

### කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයන්හි / විද්‍යායතනයන්හි සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සතු අයිතිය

1. **විශ්වවිද්‍යාල පද්ධතියෙන් පිටත සේවය**

1.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන්ගේ කාලය, දැනුම, සහජ දක්ෂතා සහ නිපුනත්වය සම්බන්ධයෙන් එකී ආයතනයන්ට සම්පූර්ණ අයිතියක් ඇත්තේ ය. වෙනත් ආකාරයකින් විය යුතු යැයි විධිවිධාන සළසා නොමැති විට, ඔවුන්ගේ වැටුප් නියම කොට ඇත්තේ ද එකී උපකල්පනයන් මත පිහිටා ය.

කාලය සම්බන්ධයෙන් සම්පූර්ණ අයිතිය ඇත

1.2 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු, නිවාඩු ගොස් සිටිය දී, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ පූර්ව අනුමැතියකින් තොර ව, ගෙවීමක් ලබා ගැනීම පිණිස තම සේවය ලබාදීමට භාර නොගත යුතු ය. විශ්වවිද්‍යාලයකට අනුබද්ධව හෝ අනුයුක්තව පවතින මණ්ඩපයක / ආයතනයක සේවකයින්, එවැනි සේවයක් ලබාදීමට පෙර එකී විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අනුමැතිය ඒ සඳහා ලබාගත යුතු වේ.

නිවාඩු පිට සිටිය දී ගෙවීමක් මත සේවය ලබාදීම

1.3 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විසින්, මෙහි පහත සඳහන් 2.3 උපඡේදයේ විශේෂයෙන් සඳහන් විධිවිධානයන්ට අනුව මිස, ගෙවීමක් හෝ ත්‍යාගයක් ලබා ගැනීම පිණිස, රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, පුද්ගලික ආයතනයක හෝ පුද්ගලයකු වෙනුවෙන් යම් සේවයක් සැපයීමට භාර ගැනීම හෝ සේවයක් ඉටු කිරීම නොකළ යුතු ය. එවැනි විශේෂිත විධිවිධාන යොදා නොමැති අවස්ථාවන්හි දී, එකී පරිදි කටයුතු කිරීමට නම් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

ගෙවීමක් හෝ ත්‍යාගයක් වෙනුවෙන් සේවය ලබාදීම

මණ්ඩපයක / ආයතනයක සේවය කරන තැනැත්තන්, එවැනි අවස්ථාවක දී තමා සේවය කරන මණ්ඩපය / ආයතනය අනුබද්ධිතව / අනුයුක්තව ඇති විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවසරය ලබාගත යුතු වේ.

1.4 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු තැනැත්තෙකු, තමා සේවය කරන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ තම වගකීම් වලට බලපෑමක් ඇති කරන්නා වූ කිසිදු පෞද්ගලික නියෝජිත භාවයක්/ පෞද්ගලික උපදේශන සේවාවක් / වෘත්තිමය කටයුත්තක් භාර නොගත යුතු ය.

පෞද්ගලික සේවාවන්

2. **පෞද්ගලික උපදේශන සේවා සහ / හෝ ඉගැන්වීමේ කටයුතු**

| | |
|---|---|
| 2.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු ආචාර්යවරුන් / නිලධාරීන් පහත සඳහන් කොන්දේසි වලට යටත් ව, පෞද්ගලික උපදේශන සේවා සහ / හෝ ඉගැන්වීමේ කටයුතු භාර ගැනීමට හැකියාව ඇත. | කොන්දේසි |
| (අ) සෑම උපදේශන සේවාවක් සහ ඉගැන්වීමේ කටයුත්තක් සඳහා ම තමා සේවය කරන කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ පාලක බල මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා තිබිය යුතු ය. | පාලක බල මණ්ඩලයේ අනුමැතිය |
| එසේ අනුමැතිය අපේක්ෂා කරමින් ඉදිරිපත් කරන සෑම අයදුම්පතක් ම, අදාල පරිදි අධ්‍යයනාංශ ප්‍රධාන සහ පීඨයේ පීඨාධිපතිවරයා මඟින් හෝ ආයතනයක ප්‍රධානියා / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා මාර්ගයෙන් පහත සඳහන් ලේඛන ද සමඟ ඉදිරිපත් කළ යුතු ය. | අනුමැතිය සඳහා අයදුම්පත් |
| (i) සේවය හෝ කාර්යය අපේක්ෂා කරන ආයතනනයේ හෝ පුද්ගලයකු විසින්, ඒ සඳහා ආරාධනය කළ ලිපිය; එම ලිපියේ අපේක්ෂිත සේවයේ හෝ කාර්යයේ ස්වාභාවය, ඒ සඳහා ගතවන කාලය සහ ගෙවීමක් කරන්නේ නම් යෝජිත ගෙවීම පිළිබඳ විස්තර ද ඇතුලත් වී තිබිය යුතු ය. | අපේක්ෂිත කාර්යයේ හෝ සේවයේ තොරතුරු |
| (ii) මෙම සේවය ඉටු කිරීමට බලාපොරොත්තු වන්නේ තම නියමිත සේවකාලය තුල දී හෝ සේවා කාලයෙන් පිටත දී ද යන්න ගැන සඳහන්, අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ප්‍රකාශයක්; ආයතනයට / විද්‍යායතනයට අයත් විද්‍යාගාර කාර්ය මණ්ඩලය, උපකරණ ආදිය, ද්‍රව්‍යයන් සහ ලිපි ද්‍රව්‍ය පාවිච්චි කරනු ලබන්නේ ද සහ එසේ පාවිච්චි කරන්නේ නම්, ඒ සඳහා යන වියදම්; පෞද්ගලික ආයතනය / තැනැත්තෙකු විසින් අදාල සේවාව / කාර්යය වෙනුවෙන් කරනු ලබන යෝජිත ගෙවීම සම්බන්ධයෙන් එකඟතාවය පළ කර තිබේද යන වග; | සේවය / කාර්යය ඉටු කරන්නේ කෙසේ ද යන්න ගැන ප්‍රකාශය |
| (iii) මෙම සේවාවන් හෝ කාර්යයන් ඉටු කිරීමට භාර ගැනීම පිණිස අවසරය ලබා දීම තුලින් අදාල තැනැත්තන්ගේ නිත්‍ය සේවා කටයුතු වලට බාධා වන්නේ ද / නැද්ද යන්න ගැන අදාල අධ්‍යයනාංශ ප්‍රධානියාගේ සහ පීඨයේ පීඨාධිපතිවරයාගේ හෝ ආයතනයක ප්‍රධානියා / විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයා විසින් දෙනු ලබන වාර්තාව; අදාල සේවය සැපයීමේ දී පාවිච්චි කරනු ලබන ද්‍රව්‍ය වෙනුවට අළුතින් එම ද්‍රව්‍ය සපයා ගැනීමේ දී වැයවන මුදල් සහ අතිකාල දීමනා වශයෙන් වැය වූ යම් මුදලක් ඇත්නම් එය ද, වෙනත් වියදම් ද ඇතොත් එම වියදම් ද නැවත අයකර ගන්නේ කෙසේ ද යන්න ගැන ලබා දෙන නිර්දේශයන් | පාලක බල මණ්ඩලයේ නිර්දේශය |

(ආ) යම් ආචාර්යවරයකු / නිලධාරියකු පෞද්ගලික උපදේශන සේවාවක් / ඉගැන්වීම් කටයුත්තක් / වෘත්තීමය කටයුත්තක් ඉටු කිරීමට භාර ගැනීම හේතුවෙන්, එකී ආචාර්යවරයා, නිලධරයා විසින් කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට විද්‍යායතනයට ලබාදිය යුතු ඔහුගේ ප්‍රධාන වගකීම වන සේවාවන්ට හානියක් නොවන අයුරින් කටයුතු කරන්නේ ද යන්න ගැන සොයා බැලීම අදාල පාලක බල මණ්ඩලය විසින් සිදු කළ යුතු ය.

අදාල තැනැත්තා විසින් ආයතනයට ලබාදෙන සේවයට හානියක් නොවන පරිදි

(ඇ) යම් උසස් අධයාපන ආයතනයක් / විද්‍යායතනයක් විසින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාග කටයුතු වලට අදාලව, කිසිදු පෞද්ගලික උපදේශන සේවාවක් / ඉගැන්වීම් කටයුත්තක් / වෘත්තීමය කටයුත්තක්, කිසිදු ආචාර්යවරයකු / නිලධාරියකු විසින් භාර ගැනීම සඳහා අවසර නොදිය යුතු ය.

විශ්වවිද්‍යාල විභාග වලට අවසර නැත

නිදහස් කිරීම

එහෙත් කොමිෂන් සභාව විසින් පනතෙහි 25 වැනි වගන්තියට අනුව හඳුනා ගනු ලැබූ, යම් උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් පවත්වනු ලබන විභාග සඳහා අවශ්‍ය පාඨමාලාවන් පවත්වනු ලබන ආයතනයක උපදේශක සේවාවන් / ඉගැන්වීම් කටයුත්තක් /එම ආයතනය වෙනුවෙන් භාර ගැනීමට එකී උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ ආචාර්යවරයකු / නිලධරයකු හට අවසර දිය හැකි ය.

(ඈ) කිසිදු ආචාර්යවරයකු / නිලධරයකු හට, අ.පො.ස (උ.පෙ) විභාගය හෝ උසස් අධ්‍යාපන ආයතනයකට / විද්‍යායතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසු යැයි හඳුනාගත් වෙනත් විභාගයකට අදාල ව කිසියම් උපදේශන සේවාවක් හෝ ඉගැන්වීම් කටයුත්තක් භාර ගැනීමට අවසර දෙනු නො ලැබේ.

අ.පො.ස. (උ.පෙ.) ආදී විභාග සඳහා නොවේ

(ඉ) යම් ආචාර්යවරයකු හෝ නිලධාරියෙකු හට, උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් විසින් පවත්වනු ලබන මොනයම් හෝ විභාගයකට සම්බන්ධ ඉගැන්වීමේ කටයුත්තකට හෝ ඒ හා සමාන වෙනත් කටයුත්තක් වෙනුවෙන් පිහිටුවන ලද පෞද්ගලික ආයතනයක හිමිකාරීත්වය දැරීමට හෝ එබඳු ආයතනයක කොටස්කරුවකු වීමට හෝ, එවැනි ආයතනයක අධ්‍යක්ෂ ධූරයක් දැරීමට හෝ ඒවායේ පාලක බල මණ්ඩලයක සාමාජිකයකු වීමට හෝ අවසර දෙනු නො ලැබේ.

පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධතාවයන්

(ඊ) උසස් අධ්‍යාපන ආයතනයක් මඟින් පවත්වනු ලබන බාහිර විභාග එකී ආයතන මඟින් සපයනු ලබන සේවාවන් හි දිගුවක් ලෙස සැලකෙන බැවින්, යම් ආචාර්යවරයකු හට එවැනි විභාගයකට අදාල පෞද්ගලික උපදේශකත්වයන් සහ / හෝ ඉගැන්වීමේ කටයුත්තක් භාර ගැනීමට පහත සඳහන් කරුණු වලට යටත් ව අවසර දිය හැකි ය.

බාහිර විභාග

(i) ආචාර්යවරයා, එකී විභාගයකට අදාල කිසිඳු කටයුත්තකට, (ප්‍රශ්නපත්‍ර සකස් කිරීමට / ප්‍රමිතිකරණයට සහ / හෝ ප්‍රශ්නපත්‍ර පරිවර්තනය කිරිමට සහ පිළිතුරු පත්‍ර පරික්ෂා කිරීමට) සහභාගි නොවිය යුතු ය.

(ii) තමන් ඉටු කිරීමට භාරගත් බාහිර විභාගයකට සම්බන්ධ පෞද්ගලික උපදේශනය/ඉගැන්වීමේ කටයුත්ත, කුමන ආකාරයකින් හෝ තමා සේවය කරන අධ්‍යයන දෙපාර්තමේන්තුවේ වගකීම් වෙත අනිසි ලෙස බල නොපාන පරිදි එනම් අදාල අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාග කටයුතු වලට බලපෑමක් නොවන පරිදි ඉටුකල යුතු ය.

(iii) එමෙන්ම, අදාල ආචාර්යවරයා විසින් අවශ්‍ය ප්‍රසිද්ධිය ලබා ගැනීම පිණිස පළ කරනු ලබන මොනයම් හෝ දැන්වීමකට, තමන් සේවය කරන උසස් අධ්‍යාපන ආයතනයේ නම කුමන හේතුවක් මත හෝ යොදා නොගත යුතු ය.

2.2 පෞද්ගලික උපදේශනයක් / ඉගැන්වීම් සේවාවක් / වෘත්තිය පැවැරුමක් භාර ගැනීම වෙනුවෙන් උපයා ගන්නා ගාස්තු බෙදා හැරීම*:*

පෞද්ගලික උපදේශනයක් / ඉගැන්වීම් සේවාවක් / වෘත්තීය පැවැරුමක් ඉටු කිරීමට භාරගන්නා ඕනෑම ආචාර්යවරයකු / නිලධාරියෙකු තමා විසින් අදාල සේවය සැපයීම තුලින් උපයාගත් ගාස්තුවෙන් කොටසක් උචිත පරිදි තමන් සේවයේ යෙදී සිටින කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට බෙදා දිය යුතු ය. එසේ බෙදා දිය යුතු කොටස පහත සඳහන් පරිදි නිගමනය වනු ඇත*;*

අයකරනු ලබන ගාස්තුවලින් කොටසක් කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට දිය යුතු ය

(i) පාවිච්චි කළ ද්‍රව්‍ය සහ පවත්වාගෙන යාමේ වියදම් (Over Heads)
උසස් අධ්‍යාපන ආයතනය සතු ද්‍රව්‍ය සහ ආයතනය පවත්වාගෙන යාමේ වියදම් ද ඇතුළුව, ලැබුනු ගාස්තුවේ වියදම් වලට අදාල කොටස, මෙම කාර්යයට ආයතනයේ යම් සේවකයකු සම්බන්ධ වුයේ නම්, ඔහුගේ අතිකාල දීමනා ද, (සාමාන්‍ය කාර්යාල වේලාවන්ට පිටින් සේවය කළ කාලය සඳහා අනුමත අතිකාල ගාස්තු ප්‍රමාණය) මෙම කොටසට ඇතුලත් විය යුතු ය.

ද්‍රව්‍ය සඳහා සම්පූර්ණ වියදම්

(ii) නියමිත කාර්යාල වේලාවෙන් පිටත දී ඉටු කරන ලද සේවය වෙනුවෙන්

(අ) අධ්‍යයන ස්වභාවයක් ගන්නා ප්‍රකාශනයක් / පර්යේෂණයක් සම්බන්ධයෙන් උපදේශන සේවාවක් ඉටු කිරීම වෙනුවෙන් නම්, එයට අදාල කිසිදු ගෙවීමක් හෝ එයින් කොටසක් නො ගෙවිය යුතු ය.

ආචාර්යවරයා / නිලධාරියාගේ සම්පූර්ණ ගෙවීම

(ආ) කරුණු එසේ වුවු ද, ලැබී ඇති මුදල කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / පාලක බල මණ්ඩලය මඟින් නිශ්චය කරන ලද මුදලට වැඩි නම්, එම මුදලෙන් දහයෙන් එකක ($^1/_{10}$) ක

සීමාවන්ට යටත් ව ගෙවීමෙන් කොටසක් විශ්වවිද්‍යාලයට

ප්‍රමාණයක් අවස්ථානුකූලව යෙදෙන පරිදි කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු ය. මෙම ප්‍රමාණය අදාල තැනැත්තා විසින් උපදේශන සේවාව / ඉගැන්වීමේ කටයුතු සිදුකල කාලසීමාවට අදාල පරිශ්‍රමිකයන්ගෙන් අඩක් ($^1/_2$) ඉක්මවා නොයන ලෙස දැක්වෙන සීමාවකට යටත් ව තිරණය කළ යුතු වේ.

(iii) සේවා කාලය තුල දී ඉටු කරන ලද සේවය වෙනුවෙන්

(අ) අදාල උපදේශන සේවාව, අධ්‍යයන ස්වභාවයක් ගන්නා, පර්යේෂණයක් / ප්‍රකාශනයක් වෙනුවෙන් නම්, ලැබීමට ඇති ගාස්තු ප්‍රමාණයෙන් දහයෙන් එකක ($^1/_{10}$) මුදලක් විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ය. — විශ්වවිද්‍යාලයට ගෙවීමෙන් කොටසක්

(ආ) අනෙකුත් අවස්ථාවල දී, ගාස්තුවෙන් තුනෙන් එකක ($^1/_3$) මුදලක් ගෙවිය යුතු වේ.

(iv) වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක බාහිර කථිකාචාර්යවරයකු ලෙස සපයන ලද සේවය වෙනුවෙන් ලබාගත් ගාස්තු වලින් කිසිදු ප්‍රතිශතයක්, තමන් සේවය කරන ආයතනයට ගෙවිය යුතු නැත. — බාහිර කථිකාචාර්ය ගාස්තු ගෙවිය යුතු නැත

2.3 ආචාර්යවරුන් / නිලධාරීන් විසින් රාජ්‍ය අංශයේ ආයතනයන් හි ඉටු කිරීමට භාරගත් වැඩ / සේවාවන් — රාජ්‍ය අංශයේ ආයතනයන් වෙත සපයන සේවාවන්

මෙම ඡේදයෙහි සඳහන් කරුණු රාජ්‍ය අංශයේ ආයතනයන් හි වැඩ හෝ සේවාවන් ඉටු කිරීමට භාරගත් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ආචාර්යවරුන් / නිලධාරීන් හට අදාල වේ.

2.4 කාර්ය මණ්ඩලයට ගෙවීම්

මෙවැනි සේවාවන් සඳහා, තම නියමිත සේවා කාලයෙන් පිටත දී සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය, ඔවුන්ගේ නියමිත අතිකාල දීමනා ගණනය කිරීමට අනුකූලව අතිකාල දීමනා ලැබීමට හිමිකම් ලබන අතර, ඒ වෙනුවෙන් වෙනත් ගෙවීමක් නොකළ යුතු ය. එවැනි අතිකාල දීමනා, ආයතනය විසින් දෙන ලද සේවාවේ කොටසක් ලෙස සහ ආයතනය විසින් කරන ලද ගෙවීමක් ලෙස ද සැලකිය යුතු ය. — නියමිත අතිකාල දීමනා

## 3. ප්‍රතිරූපන අයිතිය (Copy right)

පහතින් සඳහන් කොට ඇති දේ සම්බන්ධයෙන් ප්‍රතිරූපන අයිතිය, අදාල පරිදි කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය සතු වේ.

(අ) කවුරුන් විසින් හෝ පිළියෙල කරන ලද්දා වූ, කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක යම් ප්‍රකාශනයක් — ප්‍රකාශන

| | | |
|---|---|---|
| (ආ) | යම් අධ්‍යයන පාඨමාලාවක් හෝ පුහුණුවක් සඳහා, කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනයක් විසින් / විද්‍යායතනයක් විසින්, ඒ වෙනුවෙන් නිවාඩු හෝ වෙනත් පහසුකමක් සපයන ලද නම් සහ එවැනි පාඨමාලාවක් / පුහුණුවීමක් තුල කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ආචාර්යවරයකු, නිලධරයකු හෝ වෙනත් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද නිබන්ධනයක් හෝ ප්‍රස්තුතයක් | නිබන්ධනය / ප්‍රස්තුතය |
| (ඇ) | කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විසින්, තම රාජකාරී අනුසාරයෙන් හෝ රාජකාරීයෙ හි යෙදීම තුලින් ලබා ගන්නා වු දැනුම සහ හැකියාවන් තුලින් ද, ආයතනය විසින් තම සේවය උදෙසා ලබා දෙන ලද පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් ද, පිළියෙල කරන ලද යම් අත් පිටපතක් | අත්පිටපත් |
| (ඈ) | යම් උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් මඟින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවකට අදාල සටහන් | අධ්‍යයන පාඨමාලා සටහන් |
| (ඉ) | යම් උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් මඟින් පවත්වනු ලබන විභාගයන්ට අදාල ප්‍රශ්න පත්‍ර | ප්‍රශ්න පත්‍ර |

## 4. නව නිපැයුම් සහ පේටන්ට් බලපත්‍ර

| | | |
|---|---|---|
| 4.1 | උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විසින්, තම රාජකාරී කටයුතු කරගෙන යන අතරතුර දී සහ එකී ආයතනයක සේවය කිරීම නිසා ලබාගත් දැනුම සහ ප්‍රවීණත්වය නිසාවෙන් ද, ආයතනයේ පහසුකම් ආදිය ප්‍රයෝජනයට ගනිමින් ද, නිපදවන ලද යම් නව නිපැයුමක් සම්බන්ධයෙන් අදාල පරිදි කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට අයිතියක් ඇත්තේ ය. | යම් නව නිපැයුමක් සඳහා ආයතනයට ඇති අයිතිය |
| 4.2 | යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා, අයදුම් කරන විට, එම අයදුම් පත්‍රය, තමා සේවය කරන උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධාරයා මඟින් ඉදිරිපත් කළ යුතු ය.<br><br>මණ්ඩපයක හෝ ආයතනයක සේවයේ නියුතු තැනැත්තෙකු, තම අයදුම් පත්‍රය, එම මණ්ඩපය හෝ ආයතනය අනුබද්ධිතව / අනුයුක්තව ඇති විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ. | නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් කිරීම |
| 4.3 | පේටන්ට් බලපත්‍රයක් අපේක්ෂා කරන තැනැත්තෙකු හට ලබාදිය යුතු අයිතීන් සහ ඔහුට පැනවිය යුතු කොන්දේසි කවරේ ද යන්න ගැන, අදාල උපකුලපතිවරයා විසින් නිගමනය කරනු ඇත. මේ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා, උපකුලපතිවරයා විසින් ඒ සඳහා සුදුසුකම්ලත් ප්‍රවීන පුද්ගලයෙක්ගෙන් හෝ එවැනි ප්‍රවීන පුද්ගල සමුච්චයකින් සහය ලබා ගත හැකි ය. | අයිතීන් සහ කොන්දේසි නිගමනය කිරීම |